විශිෂ්ටයන්ගේ අතිවිශිෂ්ටයන් බිහිකරන පාඩම් මාලාව 13

බුද්ධි කලම්බනයක නව්මු මඟ

ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරග විභාගය

මෙම පාඩම් මාලාව පහත සඳහන් විෂයයන් හතරම ආවරණය කරනු ලබයි. සාමාන්‍ය බුද්ධිය, සාමාන්‍ය දැනීම, රචනය හා සාරාංශය, කළමනාකරණ අභියෝගතාවය, මෙම විෂයයන් ප්‍රශ්න පත්‍ර හතරක් ලෙසින් පහත පරිදි විභාගයට ලැබේ.
සාමාන්‍ය බුද්ධිය කාලය පැය 1 යි - බහුවරණ ප්‍රශ්න 50 යි ලකුණු 100යි
සාමාන්‍ය දැනීම කාලය පැය 2යි බහුවරණ 50 යි, ව්‍යුහගත 25 යි ලකුණු 100යි
රචනය හා සාරාංශය කාලය පැය 2 යි රචනය වචන 200යි,සාරාංශයක් ලැබූ ලකුණු 100යි.
කළමනාකරණ අභියෝගතාවය කාලය පැය 2 යි බහුවරණ 50යි ව්‍යුහගත 25 යි ලකුණු 100 යි.

සාමාන්‍ය බුද්ධිය - 4

(01) අතිල්, විමල්, සුනිල්, දිනිල් හා පියල් ද ටෙලි-විෂන්, රේඩියෝ, කැසට් රෙකෝඩර් යන භාණ්ඩ වර්ග අනුරෙන් එක් වර්ගයක හෝ කිහිපයක අයිතිකරුවෝ වෙති.

එහෙත් ඔවුන් අතරෙන් කවර දෙදෙනෙක් හෝ එකම භාණ්ඩ වර්ග 2ක අයිතිකරුවෝ නොවෙති. සුනිල්ට හා අතිල්ට ද රේඩියෝව බැගින් ඇත.

පළමු වැනි හතර දොගෙන් එක් අයකුට රේඩියෝවක් පමණක් හා තවත් එක් අයකුට කැසට් රෙකෝඩරයක් ද පමණක් ඇති අතර ඔවුන් අනුරෙන් රේඩියෝවක් ඇති එක් අයෙකුට ටෙලිවිෂන-යක්ද ඇත.

දිනිල්ට රේඩියෝවක් හෝ ටෙලිවිෂනයක් හෝ නැත. විමල්ට හා සුනිල්ට ටෙලිවිෂනයක්ද තවත් එක් භාණ්ඩයක් බැගින්ද ඇත. පියල්ට ඇත්තේ අතිල් ළඟ ඇති එහෙත් විමල් ළඟ නැති භාණ්ඩයක් හෝ භාණ්ඩ වේ. පහත සඳහන් අයට අයිති භාණ්ඩ කවරේද ?

(A) සුනිල් (B) විමල් (C) පියල්

(02) දකුණු දිගාවට මුහුණලා ඇති කණ්ණා-ඩියකින් ශ්‍රීනි, මිත්‍රා හා කාන්ති බලති. මිත්‍රා හරි මැද ද, මිත්‍රාගේ දකුණු පසින් ශ්‍රීනි ද, වම පසින් කාන්ති ද සිටිති. මිත්‍රා හා ශ්‍රීනි ඔවුනොවුන්ගේ ස්ථාන මාරු කර ගනිති.

(1) ශ්‍රීනිගේ වම පස පැත්තෙන් සිටින සේ කණ්-ණාඩියෙන් දර්ශනය වන්නේ කවුද ?

(2) කාන්තිගේ දකුණු අත කවර දිශාවකට දික්වී කණ්ණාඩියෙන් පෙනේද ?

(3) ස්ථාන වෙනස් කිරීමෙන් පසු කණ්ණාඩියෙහි පෙනෙන පරිදි මිත්‍රාට දකුණින් හා ශ්‍රීනිට වමෙන් සිටින්නේ කවුද ?

(03) රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා පරිගණක විද්‍යාව විද්‍යා පීඨයේ උගන්-වනු ලබන විෂයන් වන අතර සමාජ විද්‍යාව, ඉතිහා-සය, ජනසන්නිවේදනය හා ඉංග්‍රීසි භාෂාව කලා පීඨයේ උගන්වනු ලබයි. කලා පීඨයේ සිසුන්ට විද්‍යා පීඨයෙන් පරිගණක විද්‍යාව ද, විද්‍යා පීඨයේ සිසුන්ට කලා පීඨයෙන් ඉංග්‍රීසි භාෂාව ද හැදෑරිය හැක. සෑම සිසුවෙක්ම තම පීඨයෙන් අනිවාර්යයෙන් විෂයන් 2 සමඟ විෂයන් 3 හැදෑරිය යුතුය. සුනිල්, විමල්, කමල්, බිමල්, නිමල් හා අමල් මිතුරෝය.

- විමල් හා බිමල් එකම පීඨයේ ඉගෙනුම ලබති
- කමල් හා බිමල් පමණක් පරිගණක විද්‍යාව හදාරයි
- සුනිල් සමාජ විද්‍යාව හදාරයි
- සුනිල් හා කමල් හදාරන විෂයන් 2 සමාන වේ
- අමල් හා බිමල් රසායන විද්‍යාව හදාරයි
- විමල් ජීව විද්‍යාව හදාරන්නේ නැත
- නිමල් හදාරන්නේ තම පීඨයේ විෂයන් පමණි
- රසායන විද්‍යාව හදාරන්නේ නිදෙනෙකු පමණි
- සුනිල් හා නිමල් හදාරන විෂයන් 2 ද සමාන වේ
- නිමල් කලා පීඨයේ වන අතර ඉංග්‍රීසි හදාරන්නේ නැත
- කමල් ද ඉංග්‍රීසි හදාරන්නේ නැත
- සුනිල් ඉතිහාසය හදාරන්නේ නැති අතර කමල් සමාජ විද්‍යාව හදාරයි
- බිමල් භෞතික විද්‍යාව හදාරන්නේ නැත

* මිතුරන් 6 දෙනාගේ විෂය සංයෝජන වෙන වෙනම දක්වන්න.

(04) රමණි, කමල්, නිමාලි, අමල්, සුනිල් හා නදීකා වෛද්‍ය, ගුරු, ව්‍යාපාරික, ලිපිකරු, ගණකාධිකාරි, ඉංජිනේරු වෘත්තීන්වලු යෙදෙති.

- **රමණි** විවාහ වී සිටින්නේ ලිපිකාර සේවයේ යෙදෙන්නාගේ සහෝදරයා සමඟ වේ.
- **රමණි**, නදීකා, ගණකාධිකාරි වෘත්තියේ යෙදෙන්නාගේ රැවටේ රැකියාවට යති.
- අමල් විවාහ වී සිටින්නේ ගුරු වෘත්තියේ යෙදෙන්නා සමඟය.
- කමල්, අමල්, සුනිල් යෙදෙන්නේ ව්‍යාපාරික හෝ ගණකාධිකාරි හෝ වෛද්‍ය වෘත්තීන්වලය.
- සුනිල්ගේත්, වෛද්‍යවරයාගේත්, ලිපිකරුවාගේත් දරුවෝ ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම් ලබති.
- නිමල්ගේත්, ලිපිකාර සේවයේ යෙදෙන්නාගේත් දරුවෝ හිෂ්‍යත්වය සමඟය.
- **රමණි** හා නිමාලි ව්‍යාපාරිකයාගේ ඕරිද සමඟ සාජ්ජ සවාරියේ යති.
- සුනිල් රැකියාවට යන්නේ ව්‍යාපාරිකයාගේ රථයෙනි.
- වෛද්‍ය වෘත්තියේ යෙදෙන්නේ අමල් නොවේ.
- නිමාලි ඉංජිනේරුවාගේ කිරිදඟේ මිතුරියකි.

එක් එක් පුද්ගලයාගේ රැකියා වෙන වෙනම දක්වන්න.

(05) ගුරුවරයකු විසින් සිසුන් වෙත පැවරුම් 08 ක් දෙන ලදී. සියලුම සිසුන්ට පැවරුම් සියල්ලම සම්පූර්ණ කිරීමට නොහැකි විය. පහත දැක්-වෙන්නේ විවිධ ශිෂ්‍ය කූලක විසින් සම්පූර්ණ කරන ලද පැවරුම් කැලකයකි.

ශිෂ්‍ය කූලක	පැවරුම් කූලක
නදීරා, චමත්, අතුල	3, 4 සහ 5
නදීරා, චමත්, සිසිර	6 සහ 7
කාන්ති, නදීරා, චමත්	5 සහ 7
දීපා, චමත්, නදීරා	3, 6 සහ 8
තරංග, කාන්ති, සදීපා	2, 4, 5 සහ 8
කාන්ති, නදීරා, චමත්	3, 7 සහ 8
රජිව, තරංග, නදීරා	1 සහ 6
තරංග, කාන්ති, සදීපා	1, 5 සහ 8

1. පැවරුම් අඩුම ගණනක් සම්පූර්ණ කළ සිසුන් දෙදෙනා කවුද ?
2. සදීපා විසින් සම්පූර්ණ කරන ලද නමුත් තරංග විසින් සම්පූර්ණ නොකරන ලද පැවරුම කුමක්ද ?

(06) පංතියක පිරිමි ළමයි 06 ක් සහ ගැහැනු ළමයි 03 ක් වෙති. පිරිමි ළමයින්ගේ නම් අජිත්, සජිත්, රවින්, ප්‍රියන්ත්, ජනිත් හා ප්‍රවීන් වේ. ගැහැනු ළමයින්ගේ නම් සොහාලී, අමාලී, විමාලී, නමාලී සහ ඉමාලී වේ. පැවරුමක් කිරීමට 6 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සැදිය යුතු වේ. ඒ සඳහා පහත කොන්දේසි සැලකිල්ලට ගත යුතුය.

- අජිත් හා ප්‍රියන්ත්ට එකට වැඩ කළ හැකිය.
- නමාලී සමඟ වැඩ කිරීමට රවින් කැමති නැත.
- නමාලී හා ඉමාලී එකට වැඩ කිරීමට කැමැති ය.
- ජනිත් සමඟ එකට වැඩ කිරීමට සජිත් කැමති නැත.
- සොහාලී සමඟ එකට වැඩ කිරීමට ප්‍රියන්ත් කැමති නැත.
- සජිත් සහ විමාලී එකට වැඩ කිරීමට කැමැතිය.
- රවින් සහ අමාලී එකට වැඩ කිරීමට කැමැති ය.

* කණ්ඩායමට අජිත්, රවින්, ප්‍රියන්ත් සහ ප්‍රවීන් යන පිරිමි ළමයින් හතර දනා ඇතුළත් කළ යුතු බවයි තම කණ්ඩායමට ඇතුළත් කළ හැකි ගැහැනු ළමයින් දෙදෙනා කවුරුන්ද ?

1. සොහාලී හා අමාලී
2. අමාලී හා විමාලී
3. ඉමාලී හා නමාලී
4. නමාලී හා අමාලී

(07) මෙහි දක්වා ඇත්තේ එක්තරා කාර්යාලයක සේවය කරන නිලධාරීන්ගේ වැඩ කිරීමේ වර්යා රටාවන්ය. එය කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

a, b, c, d, e, f, g සහ h මෙම කාර්යාලයේ සිටින නිලධාරීහු වෙති.

a, c, e, f සහ h ජ්‍යෙෂ්ඨ නිලධාරීහු වෙති.

a, d, f සහ h උදේ වරුවේ සේවය කිරීමට කැමති අතර ඉතිරි අය උදේ සහ රෑ සේවය කිරීමට කැමැතිය.

a, d සමඟ එකට සේවය කිරීමට ද c, g සමඟ එකට සේවය කිරීමට ද අකමැති ය.

a සහ f සඳුද දිනවල නිවාඩු ගනිති.
a සහ c අඟහරුවාදා දිනවල නිවාඩු ගනිති.
c සහ e බදාදා දිනවල නිවාඩු ගනිති.
e සහ g බ්‍රහස්පතින්දා දිනවල නිවාඩු ගනිති.
g සහ h සිකුරාදා දිනවල නිවාඩු ගනිති.
b, d සහ h සෙනසුරාදා දිනවල නිවාඩු ගනිති.
b, d සහ f ඉරිදා දිනවල නිවාඩු ගනිති.

1. බදාදා උදේ සේවා මුරයේ සේවයට යොදා ගත හැක්කේ කවර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද ?
2. ඉරිදා රෑ සේවා මුරයේ දී සේවයේ යෙදවිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරීහු දෙදෙනා කවරහුද ?
3. සෙනසුරාදා දිනවල උදේ සේවා මුරයේ g තමැති කනිෂ්ඨ නිලධාරියා සමඟ සේවයේ යෙදවිය හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කවරහුද ?

(08) රාණි, නිලංකා, කළණි, අතුලා, වාරුණි, අවලා සහ දේශානි රටුම් මේසයක් වටේ වාඩි වී සිටිති.

අවලා වාඩි වී සිටින්නේ දේශානිට දකුණින් දෙවැන්නාය.

නිලංකා වාඩි වී සිටින්නේ අවලා ළඟ ය. එහෙත් කළණි ළඟ නොවේ.

කළණි ළඟින් වාඩි වී සිටින වාරුණි සිටිනුයේ දේශානිගේ දකුණු පසින් තුන් වැන්නාට ය.

අතුලා වාඩි වී සිටිනුයේ රාණි හා කළණි අතරය.

1. දේශානි ළඟින් ම වම පසින් වාඩි වී සිටිනුයේ කවුද ?
2. නිලංකාගේ වම් පසින් සිවු වැන්නාට වාඩි වී සිටිනුයේ කවුද ?

(09) ප්‍රදීප්, රසික, නදීන්, වරුණ එකම විශ්වවිද්‍යාලයක කලා, වාණිජ, ජීව විද්‍යා හා භෞතික විද්‍යා යන අංශවල ඉගෙනුම් ලබති (පිළිවෙළින් කොවේ)

* ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව සිසුන් රසායන විද්‍යාව විෂයක් ලෙස හදාරයි.

* නදීන් හා වරුණ 'A' කම් පාසලක අධ්‍යාපනය හදාරා ඇත. ඔවුන් 2004 වසරේ උසස් පෙළ විභාග-යට මුහුණ දී ඇත.

* ජීව විද්‍යා උපාධි අපේක්ෂකයා හා රසික එකම ප්‍රදේශයක ජීවත් වෙති.

* මෙවර රසායන විද්‍යාව විෂය සඳහා රසික වරුණට වඩා ලකුණු ලබා ඇත.

* 'A' පාසලේ කිසිවෙකුත් 2004 වසරේදී වාණිජ අංශයෙන් සරසවි වරම් නොලැබුහ.

* ඉහත සියුන් සියලු දනාම උසස් පෙළ විභාග-යට මුහුණ දී ඇත්තේ එක් වරක් පමණි.

● ප්‍රදීප්, රසික, නදීන්, වරුණ කුමන අංශ වල ඉගෙනුම ලබන්නේ දැයි පිළිවෙළින් සඳහන් කරන්න.

(10) ගයනි, නදීකා, සුමුදු, වජිරා, රෝස, ඇන්තු-රියම්, ඔකිඩ් කැනස් යන මල් වර්ග වගා කරති. (අනුපිළිවෙළින් නොවේ) කිසිවෙකු එම වර්ග දෙකක් වගා නොකරති.

* රෝස හා ඇන්තුරියන් වගා කරන්නෝ එය ව්‍යාපාරික මට්ටමෙන්ද ඔකිඩ් හා කැනස් වගා කරන්නෝ එය විනෝදාංශයක් ලෙසින්ද සිදු කරති.

* නදීකා, ඔකිඩ් වගා කරන්නිය හා ගයනි මල් වගා සංගමයක සාමාජිකාවන්ය.

* නදීකා රැකියාවක නිසුනු අතර මල් වගාව ඇගේ අමතර ආදායම් මාර්ගයකි.

* වජිරාගේ එකම ආදායම් මාර්ගය මල් වගාවයි.

* වජිරා හා ඇන්තුරියම් වගා කරන්නිය අසල්වා-සීන්ය.

● ගයනි, නදීකා, සුමුදු, වජිරා වගා කරන මල් වර්ග පිළිවෙළින් දක්වන්න.

මෙම පාඩමේ පිළිතුරු සිකුරාදා (07) පත්‍රයේ පළවේ

මීළඟ පාඩම සඳුදා (10) පත්‍රයේ පළවේ

ඉදිරිපත් කිරීම
අනුෂා ගෝකුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
බස්නාහිර පළාත්
සමාජ සේවා දෙපාර්තමේන්තුව

දිනමිණ පුවත්පත ඔබට ලබා ගැනීමේ අපහසුතා ඇත්නම් පුවත්පත් බෙදා හැරීමේ කළමනාකරු, 011 2429371, දුරකථන අංකයට හෝ 011 2429378 සහ 011 2429776 යන දුරකථන අංකයන්ට අමතා හෝ 011 2429470 යන Fax අංකයට දන්වා විස්තර ලබා ගන්න.

© 2010 .

Web2PDF
converted by Web2PDFConvert.com